දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 61 | S | I, II |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

| | |
|---|---|
| භූගෝල විද්‍යාව | I, II |
| புவியியல் | I, II |
| Geography | I, II |

*පැය තුනයි.*
*மூன்று மணித்தியாலம்*
*Three Hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**භූගෝල විද්‍යාව I**

**සැලකිය යුතුයි:**

* මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40කින්** සමන්විත ය.

* එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූල ව **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

**I - පත්‍රය**

- **අංක 1 සිට 6 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

1. වායුගෝලයේ ........................................... හා ඔක්සිජන් ප්‍රතිශතය 99.04% ක් වේ.
(නයිට්‍රජන් / ආගන් / කාබන්ඩයොක්සයිඩ්)

2. සිලිකා හා මැග්නීසියම්වලින් පෘථිවියේ ........................................... සමන්විත වේ.
(සාගරික කබොල / මහාද්වීපික කබොල / ප්‍රාවරණය)

3. ඩැනියුබ් ගංගාව ........................................... මුහුදට ගලා බසියි. (මධ්‍යධරණී / කළු / කැස්පියන්)

4. ........................................... දිස්ත්‍රික්කයේ සුළු අපනයන බෝගයක් ලෙස සාදික්කා වගා කරයි.
(බදුල්ල / මහනුවර / ගම්පහ)

5. ටින්, ක්‍රෝමියම් වැනි ඛනිජ ලබා ගැනීම ........................................... පාෂාණ වල ප්‍රයෝජනයකි.
(ආග්නේය / අවසාදිත / විපරිත)

- **අංක 6 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා, එය නිවැරදි නම් "නි" යන්න වටා ද, වැරදි නම් "වැ" යන්න වටා ද රවුමක් අඳින්න.**

6. ශ්‍රී ලංකාවේ ධමනි මිනිරන් වැඩි ම ප්‍රමාණයක් මිල දී ගන්නා රට ජපානය යි. නි /වැ
7. ශ්‍රී ලංකාවට ධනවත් සංචාරකයන්ගේ පැමිණීම මෑතක සිට වැඩි වී ඇත. නි /වැ
8. තේමා සිතියමක් යනු භෞතික හා සංස්කෘතික ලක්ෂණ ඇතුළත් වන සේ සකස් කරන ලද්දකි. නි /වැ
9. හිමාලය, ඇන්ඩීස්, රොකී ලෝකයේ ජන හීන ප්‍රදේශවලට නිදසුන් වේ. නි /වැ
10. පිලිපීන් දූපත් ආශ්‍රිත මධ්‍යම පැසිෆික් සාගරයේ ඇති වන සුළි සුළං ඇබගියෝ නමින් හඳුන්වයි. නි /වැ

- **අංක 11 සිට 15 තෙක් හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

11. දකුණු ඇමරිකා මහාද්වීපයේ රටවල් අතරින් වැඩි ම ජන සංඛ්‍යාවක් වාසය කරන රට වන්නේ ......................................... යි.
12. සමෝච්ච රේඛා ඉතාමත් ආසන්න ව පිහිටා තිබීම ....................................... බෑවුමක විශේෂ ලක්ෂණය කි.
13. ලෝකයේ උසින් ම පිහිටා ඇති විල ....................................... වේ.
14. මන්නාරම ආශ්‍රිත ව මෑතක දී ඉදි කළ සුළං බලාගාරය ....................................... ලෙස හඳුන්වයි.
15. කිරි ගව සම්පත් හුවමාරු මධ්‍යස්ථානය ....................................... ප්‍රදේශයේ පිහිටා ඇත.

- **අංක 16 සිට 19 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාරය උපයෝගී කර ගන්න.**




ඉහත ප්‍රස්තාරයට අනුව,

16. සංචාරක පැමිණීම ඉහළ ම අගයක් වාර්තා වී ඇත්තේ ................................ වර්ෂයේ දී ය.
17. අඩු ම සංචාරක පැමිණීම වාර්තා වන්නේ ................................... වර්ෂයේ දී ය.
18. සංචාරක පැමිණීම අඩු මට්ටමක සිට එකවර ම...............................වර්ෂයේ සිට වර්ධනය වී ඇත.
19. 2007 වර්ෂයේ සංචාරකයන්ගේ පැමිණීම .............................. ක් පමණ වේ.

- **අංක 20 සිට 24 තෙක් දී ඇති ප්‍රශ්නවල 'අ' හා 'ආ' යනුවෙන් තීරු දෙකක් දැක්වේ. 'අ' තීරුවේ ඇති තොරතුරු අනුපිළිවෙළට 'ආ' තීරුවේ ඇති තොරතුරු සමඟ ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

20.

| අ | ආ |
|---|---|
| 1. සුළු අපනයන බෝග | A. අගලවත්ත |
| 2. වී | B. මහඉලුප්පල්ලම |
| 3. කෘෂිකාර්මික බෝග | C. ගන්නෝරුව |
| | D. මාතලේ |

1. ADB 2. BCA 3. CAB 4. DBC (.............)

21.

| අ | ආ |
|---|---|
| 1. ඕසෝන් වායුව | A. 0.03% |
| 2. කාබන්ඩයොක්සයිඩ් | B. 0.93% |
| 3. ආගන් | C. 0.00006% |
| | D. 0.45% |

1. ABC 2. BDC 3. CAB 4. CAD (.............)

22.

| අ | ආ |
|---|---|
| 1. විසුවියස් | A. මාර්ටිනික් දූපත් |
| 2. ක්‍රැකටෝවා | B. ඉන්දුනීසියාව |
| 3. පේලි | C. අයිස්ලන්තය |
| | D. ඉතාලිය |

1. ABD 2. BAD 3. CDA 4. DBA (.............)

23.

| අ | ආ |
|---|---|
| 1. වියළි කලාපයට සීමා වූ පසකි | A. රතු දුඹුරු පස |
| 2. තෙත් හා වියළි කලාප දෙකෙහි පවතින පසකි | B. රතු දුඹුරු ලැටසොල් පස |
| 3. තෙත් කලාපයට ආවේණික වූ පසකි | C. චූර්ණමය නොවූ දුඹුරු පස |
| | D. දියළු පස |

1. ADB 2. BAC 3. CAB 4. DAB (.............)

24.

| අ | ආ |
|---|---|
| 1. මිසිසිපි මිසූරි ගඟ | A. ආක්ටික් සාගරය |
| 2. යෙනිසි ගඟ | B. පැසිෆික් සාගරය |
| 3. හොවැංහෝ ගඟ | C. අත්ලාන්තික් සාගරය |
| | D. ඉන්දියන් සාගරය |

1. ACB 2. BAC 3. CAB 4. DAC (.............)

- **අංක 25 සිට 36 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

25. පහත A සිට E දක්වා ඇති තොරතුරු අතරින් වී වගාවේ දී වියළි කලාපයට අදාළ තොරතුරු දෙකක් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

    A. වැසි ජලය හා ජල සම්පාදනයෙන් වගාව සිදු කරයි
    B. ගංගා මිටියාවත් හා පහත් ප්‍රදේශවල වී වගාව සිදු කරයි
    C. කුඩා බිම් කට්ටිවල වී වගාව සිදු කරයි
    D. සහල් අතිරික්තයක් නිපදවයි
    E. හෙල්මළු ක්‍රමයට වී වගාව සිදු කරයි

    1. A හා B 2. A හා D 3. B හා C 4. D හා E (..............)

26. 1:50,000 භූ ලක්ෂණ සිතියම්වල පරිමාණය දක්වා ඇත්තේ,

    1. ඉහළ වට තීරුවේ ය 2. මුහුණත තොරතුරු වල ය
    3. පහළ වට තීරුවේ ය 4. ඇතුළත මායිම් තීරුවේ ය (..............)

27. ශ්‍රී ලංකාවේ වාසුළි වැසි ඇති වන කාලය වන්නේ ,

    1. අප්‍රේල් - මැයි 2. ජුනි - ජූලි
    3. ඔක්තෝබර් - දෙසැම්බර් 4. දෙසැම්බර් - පෙබරවාරි (..............)

28. සංවර්ධනය මැනීමේ වර්තමාන මිනුමක් **නොවන්නේ**,

    1. දළ ජාතික නිෂ්පාදනය 2. ළදරු මරණ අනුපාතිකය
    3. සාක්ෂරතාව 4. උපතේ දී ආයු අපේක්ෂාව (..............)

29. 1:50,000 පරිමාණයේ සිතියමක 14 cm ක් දිග මාර්ගයක සැබෑ දුර වන්නේ,

    1. 3.5 Km 2. 7 Km 3. 28 Km 4. 56 Km (..............)

30. 2012 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ජන ව්‍යාප්තියට අනුව අඩු ම ජන සංඛ්‍යාවක් සහිත පළාත වන්නේ,

    1. ඌව 2. සබරගමුව 3. උතුරු මැද 4. උතුරු (..............)

31. ශිලා ගෝලය සමන්විත වන ප්‍රධාන භූ තැටි ගණන වන්නේ,

    1. 03 කි 2. 05 කි 3. 06 කි 4. 07 කි (..............)

32. ප්‍රාවරණය හා හරය වෙන් කරන අසන්තතිය හඳුන්වන්නේ,

    1. ගුටෙන්බර්ග් 2. මොහොරොවිසික්
    3. කොන්රඩ් 4. ලේමන් (..............)

33. 2013 වර්ෂයේ දකුණු ආසියාතික රටවල සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගය අඩු ම රට වන්නේ ,

1. ඉන්දියාව 2. ශ්‍රී ලංකාව 3. බංග්ලාදේශය 4. නේපාලය (..............)

34. මානුෂ සංවර්ධන දර්ශක අගය අනුව බෙදා දක්වා ඇති රටවල් කාණ්ඩ ගණන වන්නේ,

1. 03 කි 2. 04 කි 3. 05 කි 4. 06 කි (..............)

35. ලෝකයේ මුහුදු මට්ටමින් වඩාත් උසින් ම පිහිටා ඇති සානුව වන්නේ,

1. මොංගෝලියානු 2. ඩෙකෑන්
3. ටිබෙට් 4. පාමීර් (..............)

36. පෘථිවිය මත ඇති මිරිදිය ජල ප්‍රමාණයෙන් භූගත ජල ප්‍රතිශතය කොපමණ ද ?

1. 20 % 2. 38 % 3. 52 % 4. 79 % (..............)

- **පහත A, B, C හා D වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක 37 සිට 40 තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - 1. උන්නතාංශය
2. උෂ්ණත්වය

B - 1. තිරසර සංවර්ධනය
2. පරිසර සමතුලිතාව

C - 1. වනහරණය
2. නායයෑම්

D - 1. නාගරීකරණය
2. පරිසර දූෂණය

37. පළමුවැන්නේ වැඩි වීම දෙවැන්නට හේතු වන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද ?

1. A 2. B 3. C 4. D (..............)

38. දෙවැන්නේ ස්ථාවරය කෙරෙහි පළමුවැන්න බලපාන බවට දැක්විය හැකි මාතෘකා යුගලය මින් කුමක් ද ?

1. A 2. B 3. C 4. D (..............)

39. දෙවැන්නේ අඩු වීම කෙරෙහි පළමුවැන්නේ වැඩි වීම හේතු වන බවට දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද ?

1.A 2. B 3. C 4. D (..............)

40. පළමුවැන්නේ අවිධිමත් බව දෙවැන්නට හේතු වන බව දැක්විය හැකි මාතෘකා යුගලය කුමක් ද ?

1.A 2. B 3. C 4. D (..............)